# පොලිස් මාධ්‍ය කොට්ඨාසය
# பொலிஸ் ஊடகப் பிரிவு
# POLICE MEDIA DIVISION
සෙත්සිරිපාය, බත්තරමුල්ල


| | | | | | |
|---|---|---|---|---|---|
| තැ.පෙ.අංකය<br>த. பெ.இ<br>Po.Box No | 10120 | | | ෆැක්ස්<br>தொலைநகல<br>Fax | 011-2171635 |
| දුරකථන<br>தொலைபேசி<br>Telephone | 011-2887973<br>(HUNTING) | වෙබ්.ලිපිනය<br>இணையதளம்<br>Web Site | www.Police.lk | ඊ මේල්<br>மின்னஞ்சல்<br>E-mail | dir.media@police.gov.lk |


| | | | | | |
|---|---|---|---|---|---|
| මගේ අංකය<br>எனது இலக்கம்<br>My NO | 1534 /2023 | ඔබේ අංකය<br>உமது இலக்கம்<br>Your No | / 2023 | දිනය<br>திகதி<br>Date | 07/12/2023<br>පැය 0700 |

## මාධ්‍ය නිවේදනය

**පොලිස් මාධ්‍ය කොට්ඨාසය වෙත වාර්තා වූ වැදගත් තොරතුරු ජනමාධ්‍ය වෙත යොමු කිරීම.**

**01. මනුෂ්‍ය ඝාතනයකට අවශ්‍ය කර සිටි සැකකරුවෙකු අත්අඩංගුවට - මාතලේ කොට්ඨාස අපරාධ විමර්ශන අංශය.**

2023.10.25 වන දින ගලේවෙල පොලිස් වසමේ බෙලිගමුව ප්‍රදේශයේ පිහිටි ජාතික පශු සම්පත් සංවර්ධන මණ්ඩලයට අයත් ගොවිපල අලෙවිසැලේ රාත්‍රී මුරකරු ඝාතනය කර අලෙවිසැල බිඳ දේපල සොරකම් කිරීම සම්බන්ධව මාතලේ කොට්ඨාස අපරාධ විමර්ශන අංශය මඟින් විමර්ශනයක් ආරම්භ කර තිබුණි. ඒ අනුව එම අපරාධයට සම්බන්ධ සැකකරුවෙකු කොළඹ ප්‍රදේශයේ සැඟවී සිටියදී 2023.12.06 වන දින සවස් කාලයේදී තොටලඟ සේදවත්ත පාලම අසලදී අත්අඩංගුවට ගෙන ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරු වයස අවුරුදු 43 ක් වන කපුවත්ත, දඹුල්ල ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

මාතලේ කොට්ඨාස අපරාධ විමර්ශන අංශය වැඩිදුර විමර්ශන සිදුකර ගෙන යනු ලබයි.

**02. හෙරොයින් සමඟ සැකකරුවන් දෙදෙනෙකු අත්අඩංගුවට - හෝමාගම පොලිස් ස්ථානය.**

2023.12.06 වන දින රාත්‍රී කාලයේ හෝමාගම පොලිස් වසමේ විමාන පාර සහ හෝමාගම නගරයේදී පාලම හෝමාගම පොලිස් ස්ථානයේ නිලධාරීන් විසින් සිදුකල වැටලීම් දෙකකදී **හෙරොයින් ග්‍රෑම් 10 මිලිග්‍රෑම් 150 ක්** සමඟ සැකකරුවෙකු හා **හෙරොයින් ග්‍රෑම් 05 මිලිග්‍රෑම් 400 ක්** සමඟ සැකකරුවෙකු අත්අඩංගුවට ගෙන ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරුවන් අවුරුදු 29 හා 45 වයස්වල පසුවන විමාන පාර, හෝමාගම හා දකුණු පිටිපන ප්‍රදේශවල පදිංචිකරුවන් වේ.**

හෝමාගම පොලිසිය වැඩිදුර විමර්ශන සිදුකර ගෙන යනු ලබයි.

03. **මෙරට නිෂ්පාදිත ගිනි අවියක් සමඟ සැකකරුවෙකු අත්අඩංගුවට - මොරවක පොලිස් ස්ථානය.**

2023.12.06 වන දින රාත්‍රී කාලයේ දී මොරවක පොලිස් ස්ථානයේ නිලධාරීන්ට ලද තොරතුරක් මත මොරවක පොලිස් වසමේ පල්ලෙහාවත්ත ප්‍රදේශයේ දී වැටලීමක් සිදුකර මෙරට නිෂ්පාදිත ගිනි අවියක් සන්තකයේ තබාගෙන සිටි සැකකරුවෙකු අත්අඩංගුවට ගෙන ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරු වයස අවුරුදු 38 ක් වන පල්ලෙහාවත්ත, මොරවක ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

මොරවක පොලිස් ස්ථානය වැඩිදුර විමර්ශන සිදුකර ගෙන යනු ලබයි.

04. **මෙරට නිෂ්පාදිත ගිනි අවියක් සමඟ සැකකරුවෙකු අත්අඩංගුවට - මහවිලච්චිය පොලිස් ස්ථානය.**

2023.12.06 වන දින සවස් කාලයේ දී මහවිලච්චිය පොලිස් ස්ථානයේ නිලධාරීන්ට ලද තොරතුරක් මත මහවිලච්චිය පොලිස් වසමේ ජේමඩුව, රන්දූව ප්‍රදේශයේ දී වැටලීමක් සිදුකර මෙරට නිෂ්පාදිත ගිනි අවියක් සන්තකයේ තබාගෙන සිටි සැකකරුවෙකු අත්අඩංගුවට ගෙන ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරු වයස අවුරුදු 49 ක් වන රන්දූව, ජේමඩුව ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

මහවිලච්චිය පොලිස් ස්ථානය වැඩිදුර විමර්ශන සිදුකර ගෙන යනු ලබයි.

**මාධ්‍ය ප්‍රකාශක කාර්යාලය**
**පොලිස් මාධ්‍ය කොට්ඨාසය.**